# එලීනා



දෙව්මි නිමන්සා

**කෘතියේ නම**

එලීනා

**කතෘගේ නම**

**දෙව්මි නිමන්සා**

**කතෘගේ වෙනත් කෘති**

- **පුසුල්පිටිය රජමහා විහාරය**

**පාසල**

**මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

**ඉගෙනම ලබන පන්තිය -**

**8 ශ්‍රේණිය - A**

ISBN – 978-624-208-798-6
2025.02.08

**පිදුම**

**පොතක් ලියන්නට මග කියා දුන්**

**සෙනෙවිරත්න මහලේකම්**

**ගුරු පියාණනි, අප දිරිමත්කල**

**පන්තිතිභාර සුමේධා**

**ර්තණවත්ත ගුරු මෑණියනි ඔබ**

**වෙත** ........................

# පෙරවදන

 සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි  ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ  ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන්  සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **ˆහෙරණගත්කරණීv** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට  නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.  ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එලිනා කියන්නේ පුංචි ගෑණු ළමයෙක්. එයා ජීවත් වුණේ ලස්සන නගරයක.එයාගේ පවුලේ හිටියේ එලිනයි එයාගේ අම්මයි තාත්තයි අක්කයි. එයාලා සතුටින් ජීවත් වුණු පුංචි පවුලක්. එලීනා හිටියේ හය වසරේ. එලීනා හරි දක්ෂ ළමයෙක්. එලීනගේ අක්කා හිටියේ දහය වසරේ. අක්කත් හරිම දක්ෂයි. එලීනාට හිටියා හොඳ යාලුවෝ හතර දෙනෙක්. ඒ යාළුවෝ එයාට හැම වෙලාවකම උදව් කරන්න හිටියා. එයාල තමයි මැටිල්ඩා ෂැගී සොෆියා එරික් කියන්නේ. මේ යාළුවෝ හතර දෙනා එක්ක එලිනා සෙල්ලම් කරා. ඉස්කෝලෙ ගිහින් ගෙදර ඇවිල්ලා ඉස්කෝලෙන් දීපු ගෙදර වැඩ ටික කරලා

තමයි සෙල්ලම් කරන්න යන්නේ. එලීනාට තාත්තා ලොකු සෙල්ලම් ගෙදරක් හදලා දීලා තියෙනවා. මේ සෙල්ලම් ගෙදර සෙල්ලම් කරන්න එලිනගේ යාළුවො හතර දෙනත් ආවා. මෙයාලා හරිම සතුටින් ඒ සෙල්ලම් ගෙදර සෙල්ලම් කරා. මේ සෙල්ලම් ගෙදර ලස්සන කරා. තීරරෙදි දැම්මා. තීන්ත ගෑවා. මල් පෝච්චිවල මල් හිටෙව්වා. සෙල්ලම් බඩු ගෙනල්ලා සෙල්ලම් කලා. ඉතින් මේ විදියට මෙයාලා සතියට දෙපාරක් වගේ එකතුවෙලා සෙල්ලම් කරනවා. දවසක් මේ යාළුවො පස්දෙනා එකතු වෙලා එයාලා ලොකු උනහම වෙන්න කැමති කවුද කියලා කතා කර කර හිටියා. මේ යාලුවෝ පස්දෙනා එක එක අදහස් දුන්නා. මම කැමතියි වෛද්‍යවරයෙක්

වෙන්න. කියලා ශැගී කිව්වා. .මම කැමතියි ඉංජිනේරුවෙක් වෙන්න. කියලා එරික් කිව්වා. මේ වගේ අදහස් ගොඩාක් ලැබුණා. ඒ උනාට එලීනා දුන්න උත්තරය හරිම වෙනස්. එයා කිව්වා .මම කවද හරි ලොකු වෙලා අනිවාර්යයෙන්ම කාලයන්තරයක් හදනවා. ඒ කරලා ඒ කාලයන්තරයෙන් අනාගතයටත් ගමන් කරනවා. කියලා. ඊට පස්සේ මෙයාගේ යාළුවො මෙයත් එක්ක රණ්ඩු වෙන්නත් පටන් ගත්තා. සොෆියා කිව්වා .අනේ මොකක්ද අනේ ඔයාට වෙලා තියෙන්නේ ඔයාට පිස්සුද කාලයන්ත්‍රයක් හදන්න.වෙන අයගේ බලාපොරොත්තු ලොකු වෙලා හොඳ වෛද්‍යවරයෙක් වෙන්න ඒ වගේම ඉන්ජිනේරුවෙක් වෙන්න. ඒ වුණාට ඔයාගේ

බලාපොරොත්තුව බලන්නකෝ කියලා’ මැටිල්ඩා කිව්වා. . ඉතින් එතකොට සොෆියා කිව්වා කිව්වා. ‘ඇති ඇති ඔයාල ඔය රණ්ඩ වුණා ඇති. නැත්තං අපිට අදත් සෙල්ලන් කරන්න බැරි වෙනවා... අනේ මන්ද ඔයාලං අනේ’. ඉතින් ඊට පස්සේ මෙයාලා මේ රණ්ඩුව නතර කරා. ඔන්න ඉතින් දන්නෙම නැතුව හවස් වෙන්නත් ඇවිල්ලා. යාළුවො සේරම ගෙවල් වලට ගියා . එලීනා ගෙදර යන ගමනුත් කල්පනා කරේ කාලයන්ත්‍රය ගැන. එයා ගෙදර ගිහිල්ලා පුටුවක ඉඳගෙන ඉන්නකොට එයා දැක්කා එයාලගේ ගෙදර පූසත් එතෙන්ට ඇවිල්ල ඉන්නවා. එයාගේ පූසගේ නම කිටී. එයා හරිම හුරතල් චූටි පූස් පැටියෙක්. එලීනා පූස් පැටියත් එක්ක ටිකක්

වෙලා සෙල්ලම් කර කර හිටියා. සෙල්ලම් කර කර ඉන්නකොට අම්මා එතෙන්ට ආවා. අම්මා ඇවිල්ල කිව්වා .දුවේ ගිහින් මුහුණ හෝදගෙන එන්න ඊට පස්සේ මල් පූජා කරන්නත් තියනවා. කියලා. ඊට පස්සේ එලීනා ගිහින් මුහුණ හෝදගෙන ආවා. අක්කත් එක්ක ඇවිල්ල මල් පූජා කරා. මල් පූජා කරලා ඉවර වුණු ගමන්ම වගේ තාත්තත් ගෙදර ආවා. ඊට පස්සේ මෙයාලා හතර දෙනාම එකතු වෙලා රෑ කෑම කන්න තමයි ලෑස්ති වුණේ. ඉතින් කෑම මේසෙ වාඩිවෙලා එලීනයි එලිනගේ අක්කයි අම්මයි තාත්තයි සතුටින් කෑම කකා ඉන්නකොට එලීනාට එකපාරටම මතක් උනා කාලයන්ත්‍රය ගැන. එලීනා කල්පනා කර කර ඉන්නවා තාත්තා දැක්කා. තත්තා ඇහුවා .ඇයි

දුවේ ඔයා මෙච්චර කල්පනා කර කර ඉන්නෙ. කියලා.අනේ තාත්තේ මට ආසයි කාලයන්ත්‍රයක් හදන්න. කියලා එලීනා කිව්වා. ඉතින් දුවේ ඔයා ලොකු වෙලා කාලයන්ත්‍රයක් හදන්න. කියලා තාත්තා කිව්වා. .ඒ වුණාට තාත්තෙ මගේ යාලුවෝ මට විහිලු කරනවා... කියලා එලීනා කිව්වා. .ඔයා ඕව ගනන් ගන්න එපා දුවේ  ඔයා ලොකු වෙලා හොඳට ඉගෙන ගන්න. ඊට පස්සේ කාලයන්ත්‍රයක් හදන්න... කියලා තාත්තා කිව්වා.   ඉතින් මෙයාලා මේ විදියට කෑම කාලා ඉවර වුණා. එලීනා දත් මැදලා නිදාගන්න ඇඳට ගියා. එලිනා ඇදට වෙලා කාලයන්ත්‍රය ගැන කල්පනා කර කර ඉන්නකොට  එයාට දන්නේම නැතුව නින්දත් ගිහිල්ලා. එලීනට ඇහුනා උදේ වෙලා බෙල්

එක වදිනවා. ඊට පස්සේ එලිනා නැගිට්ටා. එලිනා නැගිටලා බලනකොට සේරම දේවල් වෙනස් වෙලා. එයාට හිතාගන්නවත් බැරි විදිහට වෙනස් වෙලා. එයා කල්පනා කරා මොකක්ද දෙවියමේ මේ වෙලා තියෙන්නේ කියලා එලිනා කල්පනා කරා. එලීනා හොඳටම බය වුණා. මම මේ කොහෙද ඉන්නේ මම මේ ගෙදර නෙමේද ඉන්නේ. එලිනා ඒකත් කල්පනා කරා. ඉතින් ටික වෙලාවක් එයා ඇඳට වෙලා මේ ගැන කල්පනා කර කර ඉන්නකොට අම්මා කාමරේට ආවා .ආ.. දුවේ ඔයා උදේම නැගිට්ටද. කියලා අම්මා ඇහුවා. ඔව් මම... මම... උදේම නැගිට්ට කියල ගොතා ගහ ගහ එලීනා කිව්වා. ඉතින් ඊට පස්සේ එලීනා

පල්ලෙහා තට්ටුවට ගියා ගෙදර සේරමත් වෙනස් වෙලා. මෙයාට හිතාගන්න බෑ මොකක්ද මේ එක රැයකින් උනේ කියලා. ඊට පස්සේ එලීනාගේ අම්මා එලීනට තේ එකක් හදලා ගෙනල්ල දුන්නා. එලිනා පුටුව උඩ ඉඳගෙන තේ එක බිබී හිටියා. ඊට පස්සේ එයාගෙ අම්ම ඇහුවා .ආ..දුවේ මං ඔයාගෙන් අහන්න මයි හිටියේ .ඔයා අර දහය වසර පොත් ටික තාත්ත එක්ක ගෙනාව නේද. ඊට පස්සේ එලීනාගේ බය තව තවත් වැඩි වුණා. ඉතිං ඊට පස්සේ එලිනා අම්මට මෙහෙම කිව්වා. ‘අම්මා මම උඩ තට්ටුවට ගිහිං එන්නම්’ කියල එලීනා උඩ තට්ටුවට ගියා. එලිනා උඩ තට්ටුවට ගිහින් එයාගේ කාමරේ ඇඳට වෙලා කල්පනා කරා මොකක්ද මේ

අම්මට වෙලා තියෙන්නේ කියලා එයා එයාගේ පොත් රක්කය ලගට ගියා. එතන තිබුනු පොත් අරගෙන බැලුවා . එතන ඇත්තටම තියෙන්නේ දහය වසරේ පොත්. ඊයේ හය වසරේ හිටිය මම අද උදේ නැගිටිනකොට දහය වසරේ.. එලීනා පුදුමයෙන් වගේ කල්පනා කලා. ඉතින් ඕන්න ඔහොම ඉන්නකොට එයාට මතක් උනා එයාගේ හොදම යාලුවෝ හතර දෙනා .එයා ඊට පස්සේ අම්මට කිව්වා .අම්මේ... මගේ යාළුවෝ මෙහේ ආවද. කියලා. .ඇයි දුවේ ඔයා එහෙම අහන්නේ මේ ළඟකදිත් එයාලා මෙහේ ඇවිල්ල ගියානේ.. කියලා අම්මා කිව්වා. .ඇවිල්ල ගියා.... ඒ කියන්නේ එයාලා සෙල්ලම් කරන්න නෙමේද මෙහෙ එන්නෙ.

එලීනා ඇහුවා. .අනේ දුවේ ඔයා මොනවද මේ අහන්නේ ඔයාල දැන් සෙල්ලම් කරන වයසක ද ඉන්නේ.... ආ... දුවේ අද හවස සොෆියා එනවා කිවුවා. කියලා. අම්මා කිව්වා. ඊට පස්සේ හවස් වෙනව දැනුනෙත් නැහැ. ටික වෙලාවකින් දොරට ගහන සද්දයක් ආවා. ඊට පස්සේ එලිනාගේ අම්මා ගිහින් දොර ඇරියා. එතකොට සොෆියා ඇවිල්ලා. එලීනාගේ අම්මා එලීනාට කතා කරා දුවේ මෙහෙ එන්න ඔයාගේ යාළුවෙක් ඇවිල්ලා ඉන්නවා කියලා. ඊට පස්සේ එලීනා පල්ලෙහාට ආවා. එලීනා පහලට ආවා. එයාගේ යාලුවා සොෆියා ඇවිල්ල. එලීනා එයාගේ යාළුවාට ගේ ඇතුලට එන්න කියලා කිවුවා. එයාලා ටික වෙලාවක් කතා කර කර හිටියා. ඊට පස්සේ එලීනා මේ

වෙච්ච හැම දෙයක් ම සොෆියට කිව්වා. ඊට පස්සේ සොෆියා කිව්වා .අනේ ඔයා ලොකු හීනයක්වත් දකින්න ඇති. එලීනා කියලා . .එහෙම වෙන්නේ කොහොමද. කියලා එලීනා ඇහුවා. ඉතින් ඊට පස්සේ සොෆියා කිව්වා. .එහෙම වෙන්න බෑ එලීනා. ඊයේ හය වසරේ හිටිය ඔයා අද උදේ නැගිටිනකොට කොහොමද දහය වසරට එන්නේ. කියලා. එයාල දෙන්න ඔහොම ටිකක් වෙලා කතා කර කර හිටියා. ඊට පස්සේ එලීනාගේ අම්ම එතෙන්ට ආවා. එලීනටයි සොෆියාටයි එලීනගේ අම්මා බොන්න බීම දෙකකුත් හදාගෙන ඇවිල්ල තිබුණා. එයාල බිම බොන ගමන් කතා කර කර හිටියා. එලීනා ඇහුවා .ඔයා හෙට ඉස්කොලේ යනවද සොෆියා.

කියලා. .හෙට ඉස්කෝලේ යන්න.... හෙට ඉස්කෝලේ නිවාඩු දවසක් එලිනා. කියලා සොෆියා කිව්වා. ඊට පස්සේ එලිනා කිව්වා. .ආ.... එහෙමද හා.. හා.. හරි. කියලා. ඉතින් මේ දෙන්නා ටික වෙලාවක් කතා කර කර හිටියා. කතා කර කර ඉන්නකොට දන්නෙම නැතුව හොඳටම හවස් වෙලා සොෆියා ගෙදර යන්න ගියා. ටික වෙලාවකින් එලිනාගේ තාත්තත් ගෙදර ආවා. එලිනා තාත්තත් එක්ක ටික වෙලාවක් කතා කර කර හිටියා. එතනට අම්මාත් අවා. .පොඩි දුවේ අක්ක කෝල් කරා. අක්කා හෙට ගෙදර එනවා. කියලා කිව්වා. එලිනා ආයෙත් සැරයක් බය වුණා. .අම්මේ අක්ක එනවා..... අක්කා කොහෙද ගියේ.

කියලා අම්මගෙන් ඇහුවා. ඊට පස්සේ අම්මා කිව්වා .ඇයි දුවේ ඔයා එහෙම අහන්නේ අක්කට කැම්පස් එකෙන් නිවාඩලු. අක්කා හෙට ගෙදර එනවා. කියලා කිව්වා. ඊට පස්සේ තාත්තා කිව්වා .ආ.. එහෙමද එහෙනම් මම හෙට උදේ ගිහින් ලොකු දුවව එක්කන් එන්නම්. කියලා තාත්තා කිව්වා. මෙයාල රෑට කෑම කාලා නිදාගන්න ගියා. එලීනට නම් රෑ තිස්සේ කිසිම නින්දක් නෑ.ඒලිනා හොඳටම බයවෙලා වගේම මේ අක්කට මොකක්ද උනේ කියලා කල්පනා කර කර හිටියා. ඔන්න ඉතින් ඊලග දවසේ උදේ වුණා. ඊට පස්සේ උදේම එලිනගේ තාත්තා අක්කව එක්කගෙන එන්න ලෑස්ති වුනා. ටික වේලාවකින් තත්තා අක්කව එක්කගෙන ආවා. එලීනා එතනට

ගියා. එලීනා කිව්වා .අක්කේ මේ ඔයාමද ඉන්නේ. කියල . එලීනාගෙන් අක්කා කිව්වා. .මොකක්ද ඔයාට වෙලා තියෙන්නේ නංගී ඔයා නිකං මාව මාස ගානකින් දැකලා නෑ වගේනෙ කතා කරන්නේ. කියලා. ඊට පස්සේ ටික වෙලාවක් අක්කත් එක්ක කතා කර කර ඉදලා එලිනගේ කාමරේට යන්න ගියා. ඒ කරලා එලීනා එතෙන්ට වෙලාත් කල්පනා කරන්න පටන් ගත්තා. මොකක්ද මේ උනේ කියලා. එයා හිතුවා ආයෙනම් ජීවිතේටවත් මේ කාලයන්ත්‍රය ගැන හීනෙන්වත් හිතන්නෙ නෑ කියලා. ටික වෙලාවක් ගියා හවස් වුණා. එලිනා මූන හෝදගෙන බුදුන් වැන්දා. ඒ කරලා රෑ කෑම කන්න කෑම මේසෙ ඉඳගත්තා කෑම මේසෙ ඉඳගත්තට පස්සේ එයාල

හතරදෙනා සතුටින් කෑම කෑවා. එළිනා ඒ වෙලේ ඒ සියලු දේවල් අමතක කරලා එයා සතුටින් හිටියා. ඊට පස්සේ එයාලා දත් මැදලා නිදාගන්න ගියා.එළිනාට කවුද කතා කරන සද්දයක් ඇහුනා. එයා එකපාරට නැගිටලා බැලුවා එතකොට එයාගේ ඇද උඩ අම්මා ඉඳගෙන ඉන්නවා එයා දැක්කා. .ඇයි අම්මේ මොකද වුණේ කියලා එලීනා කිව්වා. .දුවේ ඔයා ඇයි මෙච්චර දවල් වෙනකන් නිදාගෙන ඉන්නේ දැන් වෙලාව කීයද බලන්නකෝ. කියලා එලීනාගේ අම්මා කිව්වා. .මේ දුවේ ඔයා අද සෙල්ලම් කරන්න යනවා කිව්වා නේද දැන් වෙලාව උදේ එකොළහත් පහු වෙලානේ ඔයා අද සෙල්ලම් කරන්න යන්නේ නැද්ද**?** ඇයි අම්මේ එහෙම

අහන්නේ... මම දැන් දහය වසරනේ ඉන්නේ. මම දැන් සෙල්ලම් කරන්න යන්නේ නෑ .ඇයි දුවේ ඔයාට මොකක්ද උනේ ඔයා කොහෙද දහය වසරෙ ඔයා තාම ඉන්නේ හය වසරෙ නේ. කියලා අම්මා කිව්වා. එලිනා අම්මට මේ වෙච්ච හැමදේම කිව්වා. ඊට පස්සේ අම්මා කිව්වා .පුතේ ඔයා ලොකු හීනයක් දැකලා තියෙනවා.කමක් නෑ ඔයා බයවෙන්න එපා ඔයා හොඳට ඉගෙන ගන්න ඊට පස්සේ ඔයා කාලයන්ත්‍රයකුත් හදන්නකෝ. කියලා අම්මා කිව්වා. ඔන්න ඉතිං ඊට පස්සේ මේ පවුලෙ අය හරිම සතුටින් ජීවත් වුණා.



පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්